# රත්න ප්‍රාසාදයේ මුරගල දක්වා මුරගලේ විකාශනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්.පී. නිසංසලා රත්නතිලක* [1]

මුරගල් යනු පූජනීය හෝ රාජකීය ගොඩනැගිල්ලකට පිවිසෙන ද්වාරයේ දෙපසින් කොරවක්ගල් ආවරණය වන අන්දමට බිම් මට්ටමේ පිහිටුවා ඇති හතරැස් පැතලි ගල් පුවරු වේ. මෙම මුරගල් අතීතයේ පටන් නොයෙකුත් වෙනස්කම්වලට භාජනය වෙමින් විකාශනය වී පැමිණි බව ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ කලා නිර්මාණ අතර ඇති එක් සුවිශේෂී කලා නිර්මාණයක් වන මෙම මුරගල පැරණි දේශීය කලාකරුවාගේ නිර්මාණ කුසලතාවන් හා ශිල්පීය කුසලතාවන් පිළිබිඹු කරන කැටයම් අංගයක් වන අතර එය ලක්දිවට ආවේණික කලා නිර්මාණයක් ද වේ. මුරගලේ විකාශනය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී එය නොයෙකුත් වෙනස්කම්වලට භාජනය වෙමින් පැමිණ පසු ව රත්න ප්‍රාසාදයේ මුරගල දක්වා නිර්මාණාත්මක අන්දමින් වර්ධනය වූ බව සඳහන් කළ යුතු ය. මුරගලේ විකාශනය කෙබඳු ස්වරූපයකින් සිදු වූයේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුවයි. ඒ අනුව මුරගලේ විකාශනය පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වන අතර මෙහි දී ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරමින් ප්‍රාථමික මූලාශ්‍රය වසයෙන් ගොඩනැඟිලි නටබුන් ද, ද්විතීයික මූලාශ්‍රය ලෙස පොත්පත්, පුවත්පත්, සඟරා සහ පුස්තකාලය පරිහරණය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. ඒ අනුව දත්ත විශ්ලේෂණය කිරීමේ දී මුදුනේ දෙකොන් හැඩ ගන්වන ලද කැටයම් රහිත දිග හතරැස් මුරගල, මුදුනේ ගැටය සහිත මුරගල, පුන්කලස සහිත මුරගල, වාමන රුව සහිත මුරගල, නාග රුව සහිත මුරගල එහි ලා බෙහෙවින් වැදගත් වන බවත් මෙම මුරගලට බහිරව රූප වෙනුවට ධෘතරාෂ්ට, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන සතර වරම් දේව රූප එකතු වී තිබීම මෙහි විශිෂ්ට අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකි බවත් නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පද:*** ගොඩනැගිලි, විකාශනය, මුරගල, කැටයම්, රත්න ප්‍රසාද

[1] සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය nisansalarathnathilaka99@gmail.com